# මොඩියුල අංක 01

# ක්‍රියාකාරී ඉගෙනුම

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# ක්‍රියාකාරී ඉගෙනුම



රටක අනාගතය වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලිය අනුව තීරණය වේ. එම නිසා ලෝකයේ වේගවත්ව සිදු වන අධ්‍යාපනික වෙනස්කම් සමඟ අප යාවත්කාලීන විය යුතුය. පාසල, අධ්‍යාපන ක්‍රියාවලියේ ඉහළින් ම සිටිනආයතනයකි. පුංචි පන්ති කාමරයක් හෝ ඔබට ඉගැන්වීම් කාර්ය සඳහා ලැබෙන ඕනෑමස්ථානයක හෝ සිට ඔබ කරන සුවිසල් මෙහෙය මගින් රටක් තනන බව ,ලොවක් තනන බව, ඔබ සිතුවාද? ඒ අනුව ඔබ කරන මෙ හෙය කෙතරම් වැදගත් ද?

කිසියම් අවස්ථාවක සිදු වන ඉගෙනීමක් කෙරෙහි එම මොහොතේ ඒ පුද්ගලයා හා සම්බන්ධ සියලු විචල්‍යයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඉතා දැඩි ලෙස බලපාන බව කර්ට් ලෙවින් පවසයි. ඔහුගේ අදහස වන්නේ ඉගෙනුම් අවස්ථාවකදී ඉගෙනුම් ලාභියා භෞතික ලෝකය හා මනෝ විද්‍යාත්මක ලෝකය යන ලෝකදෙකක සිටින බවයි. භෞතික ලෝකයේ කිසියම් නිශ්චිත සීමාවක් තුළ විය හැකි වුවද මනෝ විද්‍යාත්මක ලෝකය මොහොතින් මොහොත වෙනස් වන බවයි.ඉගෙනුම් කටයුතු සැලසුම් කිරීමේ දී ගුරුවරයා විසින් ශිෂ්‍යයාගේ භෞතික හා සමාජ පසුබිම ද ඒ අවස්ථාවේ ශිෂ්‍යයාගේ මනෝ විද්‍යාත්මක ලෝකය සැකසෙන ආකාරය ද අවබෝධ කර ගැනීම අවශ්‍යවේ.

ශිෂ්‍යයාගේ චින්තනය තුළට සම්බන්ධව කටයුතු කිරීමේ නිපුණතාවය ගුරුවරයා සතු විය යුතුය. ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සුහදශීලී සම්බන්ධතාව අධ්‍යාපනයට මගපෙන්වන ආකාරයෙන්, පන්ති කාමරය තුළ සාරවත් ඉගෙනුම් පරිසරයක් සකසා ගැනීම අවශ්‍ය වේ . ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් නව අදහස් ගවේෂණයට, පවතින අදහස් නැවත සකස් කරගැනීමට, විවිධ විද්‍යාත්මක සම්බන්ධතා දැකීමට, භාවිතයට, නව්‍යතා සංයෝජනය ට ත්, විවිධ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල නිරත වීමට අවස්ථාව ලබාදීම මගින් ඉගෙනුම් ලාභියාගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගනිමින් ගුරුවරයා ට සම්පත් දායකයෙකු පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියාත්මක වීම සඳහා මඟ පෙන්වීමක් ලෙස මෙම මොඩියුලය ඉදිරිපත් කරමු.



මෙම මොඩියුලය හැදෑරීමෙන් ඔබට ඉටු කරගත හැකි අරමුණු මෙසේය.

1. ක්‍රියාකාරී ඉගෙනුම් පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
2. ඉගෙනුම් පාදක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය නිපුණතා ගොඩ ගොඩනගා ගැනීම.

ඉගෙනුම් ඵල

- ක්‍රියාකාරී ඉගෙනුම් සඳහා යෝග්‍ය ඉගෙනුම් ශිල්ප ක්‍රම හඳුනා ගනියි .
- ශිෂ්‍යයා ට, පාඩමට, ගැළපෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිතා කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙයි.
- ළමා මිතුරු ඉගෙනුම් පරිසරයක් ඇති වේ.
- ශිෂ්‍යයා සුසත්‍ය ඉගෙනුමක නිරතවීම මගින් සාධනය ඉහළ යයි .

අනු මාතෘකා

1. ක්‍රියාකාරී ඉගෙනුම යනු කුමක්ද ?
2. ක්‍රියාකාරී ඉගෙනුම ගුරුවරයාට සහ සහ ශිෂ්‍යයා ට වැදගත් වන්නේ ඇයි ?
3. ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම භාවිතයේ දී මතුවිය හැකි ගැටලු හා අභියෝග හඳුනා ගැනීම හා ඒවා මග හරවා ගැනීම.
4. විවිධ ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම හඳුනා ගැනීම.

## 1. ක්‍රියාකාරී ඉගෙනුම යනු කුමක්ද ?

- ඉගෙනුම් ක්‍රියාවලියට සිසුන් ක්‍රියාශීලී ව හෝ අත්දැකීම් සහිතව හෝ සම්බන්ධ වන අතර සිසුන්ගේ සහභාගීත්වය මත පදනම් ව විවිධ මට්ටමේ ක්‍රියාකාරී ඉගෙනුම් පවතින ඉගෙනුම් ක්‍රමයකි.

- සිසුන් දේවල් කිරීම් හා ඔවුන් කරන දේ ගැන සිතීම සම්බන්ධ ඕනෑ ම දෙයක්

(බොන්වෙල් සහ අයිසන් 1991)

- ළමුන් කියවිය යුතුය, ලිවිය යුතුය,සාකච්ඡා කළ යුතුය, ගැටලු විසඳීමේ නිරත විය යුතුය, මෙම ක්‍රියාවලිය දැනුම, කුසලතා හා ආකල්ප ලෙස හඳුන්වන ඉගෙනීමේ අරමුණුවලට සම්බන්ධ වේ. විශේෂයෙන් ළමයින් විශ්ලේෂණය, සංස්ලේෂණය, ඇගයීම හා නිර්මාණශීලිත්වය වැනි ඉහළ පෙළේ සිතීමේ කාර්යයේ නිරත විය යුතුය.

උසස් අධ්‍යාපනය සඳහා වූ සංගමය (ASHE) - ක්‍රියාකාරී ඉගෙනීම සංවර්ධනය

"ක්‍රියාකාරී ඉගෙනීම" යන යෙදුම නිසැකවම අලුත් එකක් නොවේ. "ක්‍රියාකාරී ඉගෙනීම සාමාන්‍යයෙන් අර්ථ දැක්වෙන්නේ ඉගෙනුම ක්‍රියාවලියට සිසුන් සම්බන්ධ කර ගන්නා ඕනෑම උපදේශාත්මක ක්‍රමයක් ලෙස ය."

මයිකල් ප්‍රින්ස්

### Active Learning

- **Active learning** refers to techniques where students do more than simply listen to a lecture. Students are DOING something including discovering, processing, and applying information.

ක්‍රියාකාරී ඉගෙනුමට පදනම වන්නේ නිර්මාණාත්මකවාදී න්‍යායය යි.


නිර්මාණකරුවන් විසින් පවසන පරිදි ,

- ඉගෙන ගන්නා තමන්ගේ ම අවබෝධය ගොඩනගා ගනියි.
- ඉගෙනීම යනු අර්ථයක් ඇති කිරීමේ ක්‍රියාවලියකි.
- ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉගෙන ගන්නන් ඔහුගේ පවත්නා දැනුම සහ අවබෝධය වර්ධනය කරයි.
- අදහස් විශ්ලේෂණය කිරීමට, ඇගයීමට හා සංස්ලේෂණය කිරීමට ඉගෙන ගන්නන්ට වැඩි හැකියාවක් ඇති බවයි.( බ්ලූම්ගේ වර්ගීකරණයේ ඉහළ පෙළේ සිතීමේ කුසලතා **HOT** ළඟා කර ගැනීමයි.)
- ගැඹුරු ඉගෙනීමට රුකුල් දෙන ඉගෙනුම් පරිසර, අවස්ථා , අන්තර් ක්‍රියා, කාර්යයන් සහ සුදුසු උපදෙස් ලබා දීමෙන් ශිෂ්‍යයන්ගේ ගැඹුරු අවබෝධය වඩාත් වැඩි කරවයි.
- ඉගෙනීම ප්‍රධාන වශයෙන් සිදුවන්නේ ගුරුවරයෙකු හා සිසුන් හෝ වෙනත් අය සමග ඇති සමාජ අන්තර්ක්‍රි යා හරහා ය.

දාර්ශනිකයකු වන ජීන් ජැක් රූසෝ 1972- 1778 ඉගෙනීම, සෑම විටම අදාළ විය යුතු අතර අර්ථවත් සන්දර්භයක් තුළ තිබිය යුතුය යන අදහස් වර්ධනය කරන ලදී .ඒහි මූලික අදහස වන්නේ අප ඉගෙන ගන්නා දේ වල ප්‍රයෝජන දැක එය සැබෑ ලෝකයට සම්බන්ධ කල හැකි වීමය. මේ අනුව ක්‍රියාකාරී ඉගෙනුම යනු ශිෂ්‍යයා ස්වාධීනව ඉගෙන ගැනීමේ ක්‍රියාවලිය අර්ථාන්විතව තමන් යටතට දිශානුගත කර ගැනීමයි.

ඉතින් අපි සරලව හිතමු. ඔබට වාහන පැදවීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ඕනෑම ලිඛිත විභාගයට පෙනී සිට සමත් විය හැකි ය. එහෙත් ඔබට මෝටර් රථයක් පැදවීම සඳහා හැකියාවක් ලබා ගැනීමට එය ප්‍රමාණවත් නොවේ. කියවීමෙන් හෝ සවන් දීමෙන් හෝ ඉගෙන ගත් දේ සහ ක්‍රියාවෙන් ඉගෙන ගත් දේ අතර පරතරය ඔබට නිසැකවම දැනී ඇත. සක්‍රිය ඉගෙනීමේ අවශ්‍යතාවය මතු වන්නේ එතැනිනි, නිතැතිනි.

ඉතින් අපි පැනක් හා කොළය අතර සටනින් ඔබ්බට ගමන් කළ යුතුය.



## 2. ක්‍රියාකාරී ඉගෙනුම ගුරුවරයාට සහ සහ ශිෂ්‍යයා ට වැදගත් වන්නේ ඇයි ?

අපි මොහොතකට ඔබේ පන්ති කාමරයට යමු ද ?

ඒහි ශිෂ්‍යයන් කී දෙනෙක් ඉන්නවා ද ?

ඔවුන් වැඩිය කැමති මොනවාට ද ?

ඔබ උගන්වන්න වැඩිය කැමති කොහොම ද?

ඔබෙ කටහඬ පන්ති කාමරයේ හැමෝටම ඇහෙනව ද ?


පෙළපොතට අමතර තොරතුරු ඔබ පන්ති කාමරයට රැගෙන යනව ද ?

පාඩම සම්බන්ධයෙන් දරුවන්ගේ අත්දැකීම් ධනාරෝපණය සඳහා ඔබ පියවර ගන්නවද

කාලච්ඡේදය අවසානයේ ඔබ වෙහෙසින් ද ?

ඉගෙනුම සහ ඉගැන්වීම් ශිෂ්‍යයන්ට වගේම ඔබටත් රසවත් අත්දැකීමක් කරගැනීමට ඔබ සූදානම් ද ?


ඔබේ පන්ති කාලච්ඡේදය තුළ වඩාත් ම වෙහෙස මහන්සි වී වැඩ කරන්නේ ඔබ ම මිස ශිෂ්‍යයන් නොවේ නම් ඔබ ක්‍රියාකාරී ඉගැන්වීම ස හා යොමු වීමට කාලය යි.




සිසුන් ඉගෙන ගන්නේ කෙසේද ?

සිසුන් ඉගෙන ගන්නේ එයාලා කැමති විදිහටයි.


සිසුන් කැමති විදිහ හඳුනා ගැනීම තුළින් අපට ඔහුන් අකමැති විදිය මග හැරීම පහසුය.





සෑම දරුවෙක් ම එකම සංකල්පය වුණත් ඉගෙන ගැනීමට විවිධ ක්‍රම භාවිතා කරයි. එක සංකල්පයක් සවන් දීමෙන් ඉගෙන ගන්න ළමයෙක් තවත් සංකල්පයක් ඉගෙන ගන්නේ වෙනත් ක්‍රමයකින් විය හැකිය.

අපට පාඩම් සැලසුම් කිරීමේදී මේ කරුණු සැලකිල්ලට ගන්න සිදුවෙනවා (එක දරුවෙක් ඉගෙන ගන්නා ක්‍රමයට ම තවත් දරුවෙක් ඉගෙන නොගැනීම නිසා එම දරුවා අනිත් දරුවාට වඩා අදක්ෂ බව, බෑ කියා ලේබල් කිරීම වැරැද්දක්. සැබෑ ම හේතුව පාඩම ඉගැන්වීමට භාවිතා කළ ක්‍රමය දරුවා ඉගෙන ගන්නා ක්‍රමය නොවීම විය හැකියි.)

පන්ති කාමරයේ ඉගෙනුම් අවස්ථා සංවාද






## ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රතිලාභ

**සිසුන් යාවජීව අධ්‍යාපනයට යොමු කිරීමට**

ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් බවට පත් කිරීමට උපකාරී වේ. ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රවේශයේ දී , ඉගෙනීම යනු ක්‍රියාවෙන් යමක් ඉගෙන ගැනීමයි. මෙයින් සිසුන්ගේ ස්වාධීනත්වය සහ ඉගෙන ගැනීමේ හැකියාව වර්ධනය වේ. සක්‍රිය ඉගෙනුම සිසුන්ගේ ඉගෙනීම කෙරෙහි වැඩි මැදිහත්වීමක් හා පාලනයක් ලබා දේ.පාසල් කාලයෙන් පසුව ද ඉගෙනීම

**සහයෝගීතා කුසලතාව වර්ධනය කරයි**

සහයෝගීතාවය යනු වඩාත් ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රවේශයන් ගේ කුලුනකි. කණ්ඩායම් කඩිනමින් එකට වැඩ කිරීමෙන් ශිෂ්‍යයන්ට ශ්‍රම බලකාය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය හැකියාවන් වර්ධනය වේ.

**අවදානම් ගැනීම දිරිමත් කරයි**

සිතුවිලි බෙදා හදා ගැනීම , එළඹුණු නිගමන ආරක්ෂා කිරීම, එකිනෙකාගේ අදහස් විමසීම, එකිනෙකා සමග අදහස් ගොඩ නගා ගැනීම ,අන් මත ඉවසීම වඩාත් පහසු වන විට ඔවුන් විශ්වාසය සහ ස්වයං හිමිකම ලබා ගනී

**විශ්ලේෂණාත්මක චින්තනය වැඩිදියුණු කරයි**

වැරැද්ද සමාජගත වී ඇති ලෝකය තුළ නීත්‍යානුකූළ ප්‍රභවයන් හඳුනා ගැනීමට හෝ වැරදි තර්කයන් හඳුනා ගැනීමට ඇති හැකියාව වඩා වැදගත් වේ. ක්‍රියාකාරී ඉගැනීමේ කේන්ද්‍රය සැකයෙන් තොරව තොරතුරු ලබා ගැනීමේ සිට අදහස් බෙදා ගැනීමේ දී වඩාත් ශක්තිමත්ව

**සිත් ඇද ඇදගන්නා සුලුය**

ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රවේශය සියලුම සිසුන් ට ඔවුන්ගේ ඉගෙනීම කෙරෙහි අවධානයෙන් සිටීමට දිරිගන්වන අතර එමගින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වැඩි උද්යෝගයක් ලබා දෙනු ඇත.

**සාර්ථකත්වයට අනුබල දෙයි**

ලිවීම හා කට පාඩමට වඩා අදහස් අවබෝධයට, සංස්ලේෂණයට, ක්‍රියාකාරී ඉගෙනුමෙන් හුරු වෙයි. කුසලතා සහ අවබෝධය මත පදනම් ව ඉහළ සාමාර්ථ ලබා ගැනීමට උපකාරී වේ. කාර්යය ඉටු කිරීම දිරිගැන්වීම මගින් උසස් අධ්‍යාපනයට ද වැඩ

**ස්මෘතිය වැඩිදියුණු කරයි**

එඩ්ගා ඩේල්ගේ අත්දැකීම් කේතුව ට අනුව සිසුන්ට කියවන දේ වලින් 10% අසන දේවල් වලින් 20% ක් මතකයේ ගබඩා වන අතර ක්‍රියාකාරී අත්දැකීම් 90% මතකයේ ගබඩා වේ.


**නිර්මාණාත්මක චින්තනයට මඟ පාදයි**

නිර්මාණශීලීත්වය යනු පුද්ගලයකුට එදිනෙදා ජීවිතයට වගේ ම වැඩ ලෝකයට ද අත්‍යාවශ්‍ය ප්‍රධාන කුසලතාවයක් සේ ම සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කරමින් ඉගැන්වීමට අපහසු දෙයකි. ක්‍රියාකාරී ඉගෙනුම සිසුන්ට තේරුම් ගැනීමට උපකාරී කරයි. මොලේ නිර්මාණාත්මක අංග සංවර්ධනය කරයි. නව අදහස් හා ගැටලු වලට නව විසඳුම් ලබාදීමට සිසුන් යොමු කරයි.

**සැබෑ ගැටලු විසඳීමට අනුබල දෙයි**

**ආත්ම විශ්වාසය වැඩි කරයි**

2015 ලෝක ආර්ථික සංසදය විසින් අනාගත රැකියා ලෝකය සඳහා අවශ්‍ය වැදගත් ම කුසලතාව ලෙස සංකීර්ණ ගැටළු විසඳීමේ හැකියාව දක්වා ඇත. එසේම covid-19 විසින් ලෝකය වෙනස් කළ හැකි වේගයට වඩා වේගයෙන් වෙනස් කළ හෙයින් මෙය වඩාත් තීරණාත්මක වී ඇත. ක්‍රියාකාරී ඉගෙනුම් පන්ති කාමරයක සිසුන් ට තේරුම් ගත හැක්කේ කිසිවෙකු ට සියලු පිළිතුරු නොමැති බවත්, ඒවා සොයාගෙන හඳුනා ගැනීම ඔවුන් සතු බවත් ය.




වැඩිදුර කියවීම ස හා ( මැලේසියාවේ පර්යේෂණ )

## 3. ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම භාවිතයේ දී මතුවිය හැකි ගැටලු හා අභියෝග හඳුනා ගැනීම හා ඒවා මග හරවා ගැනීම.

### ගැටලු

**ගුරුවරයාගේ බලපෑම් ඉවත් කරයි.**

ක්‍රියාකාරී ඉගෙනුම යනු ගුරුවරයාගේ භූමිකාව අඩු කිරීමක් නොවේ.

ගුරුවරයා ,සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියේ මගපෙන්වන්නා ය/ පහසුකම් සලසන්නා ය. එබැවින් ගුරුවරයා ගේ දක්ෂ සැලසුම්කරණය ඉතා වැදගත් වේ.

ඔබ අවධානය යොමු කළ යුතු වැදගත්ම කාරණය වන්නේ

ඔබේ ශිෂ්‍යයන් ක්‍රියාකාරකමකින් ලබාගැනීමට යන්නේ කුමක්ද ?

ඔබ ලබා දිය යුතු සම්පත් හා මගපෙන්වීම් මොනවාද ?

ඔබ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කරන්නේ කෙසේද ?

**ඉගැන්වීමේ ශෛලිය හා පන්ති කාමර සැකැස් ම සම්පූර්ණයෙන් වෙනස් වේ.**

ක්‍රියාකාරී ඉගෙනුම සඳහා පන්ති කාමරය සම්පූර්ණ වෙනසක් අදහස් නොවේ.

ඔබට නව ක්‍රියාකාරකමක් සඳහා ඉඳහිට ඉතා කුඩා පරිමාණයේ පන්ති කාමර වෙනසක් සිදු කිරීමට අවශ්‍ය විය හැකිය.

**නරක හැසිරීමට හේතුවේ.**

කණ්ඩායම් සාකච්ඡාවක සක්‍රීය ව නිරත වීමේදී ඇතිවන ඝෝෂාව මෙම අදහසට හේතුවකි. ක්‍රියාකාරී ඉගෙනුම යනු පුද්ගලයා නොව මොලේ ක්‍රියාකාරී වීම ය. එසේ නොමැතිව විනයක් නොමැති ලෙස හැසිරීම නොවේ.

### අභියෝග

- **මම ප්‍රශ්නකරණය භාවිතා කරන්නේ කෙසේද ?**
  - නැවත නැවත සිහිපත් කිරීම සහ තහවුරු කිරීම සඳහා මෙන්ම පසු විපරම සඳහා ද ප්‍රශ්න ඇසීම ප්‍ර යෝජනවත් ය.
  - සියලුම සිසුන් සහභාගී වන ලෙස කාර්ය සැලසුම් කළ යුතුය
- **මම ධනාත්මක පංතිකාමර පරිසරයක් නිර්මානය කරන්නේ කෙසේද ?**
  - සිසුන් තුළ නව අදහස් ජනිත වන හා විශ්වාසය තහවුරු වන පරිසරයක් නිර්මාණය විය යුතුය.
- **විෂය පරාසයක අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරමින් එකවර නිපුණතා වර්ධනය කිරීමට මට කටයුතු කළ හැකි ද ?**
  - මෙහිදී වැදගත් වන්නේ ඔබගේ සැලසුම් කරණය යි.
  - නිපුණතා අත්පත් කරගත හැකි ලෙස ඔබ කාර්යයන් කලින් සැලසුම් කල යුතුය.

e-Learning by TEA
Teacher Education Administration Branch

ඔබේ විෂයන්ට අදාළ ව සිතා බැලීමේ පහසුව උදෙසා පහත දැක්වෙන උදාහරණය අධ්‍යනය කරන්න.

උදා - සිසුන්ට රචනාවක් සඳහා භාවිතා කළ හැකි වැදගත් කරුණු

කිසියම් රචනා ප්‍රශ්නයකට භාවිතා කළ හැකි ප්‍රධාන කරුණු පහක් ගැන සිතන ලෙස ඉල්ලා සිටින්න.

එම ප්‍රශ්නයට පිළිතුරක කොටසක් ලෙස කෙටි ඡේදයක් ලිවීමට මෙම කරුණුවලින් එකක්වත් භාවිතා කරන ලෙස ඉල්ලා සිටින්න.

ඒකම මාතෘකාව පිළිබඳ වෙනස් රචනා ප්‍රශ්නයක් සඳහා එම කරුණු පහ නැවත භාවිතා කරන්නේ කෙසේ දැයි විමසන්න.

නව ප්‍රශ්නයක පිළිතුරු කොටසක් ලෙස ඡේදයක් ලිවීමට සිසුන් යොමු කරන්න. කරුණු සනාථ කිරීම සඳහා ඔවුන් දක්වන ලද කරුණු පහෙන් අවම වශයෙන් එකක්වත් භාවිතා කළ යුතුය

මේ මගින් සිතීමේ ඉහළ මට්ටමේ කුසලතා වෙත යොමු කරගත හැකි ය.

- මගේ පන්තියේ සෑම දරුවෙක් ම යමක් ඉගෙන ගෙන ඇති බව මා දැන ගන්නේ කෙසේද?
  - ඔබ තක්සේරු කිරීමේ කාර්යයන් ගොඩ නගන්නේ නම් සිසුන්ගෙ ඉගෙනීම පරීක්ෂා කළ හැකිය
  - ඵලදායි තක්සේරුව මගින් ඊළඟ පාඩමේ දී අවධානය යොමු කළ යුතු දේ පිළිබඳ හොඳ අදහසක් ලබාදෙයි.
  - සිසුන්ට වඩා ප්‍රයෝජනවත් වන්නේ කවර කාර්ය දැයි සොයා ගැනීමට උපකාරයක් වනු ඇත.

- පන්ති කාමරයේ ක්‍රියාකාරී ඉගෙනුම ක්‍රියාත්මක කරන්නේ කෙසේද?

- මගේ පාඩම් සැලැස්ම ට සක්‍රීය ඉගෙනුම් ක්‍රම ඇතුලත් කරන්නේ කෙසේද ?

- ස්ථාවර ආසන සහ මේස සහිත සම්ප්‍රදායික පන්ති කාමරයක ක්‍රියාකාරීකම් උපායමාර්ග ක්‍රියාත්මක කරන්නේ කෙසේද ?

- මම ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රියාකාරකම් ඒකාබද්ධ කරන්නේ කෙසේද ?

- ආවරණය කළ යුතු අන්තර්ගතය ලබා ගන්නේ කෙසේද ?

- ක්‍රියාකාරී ඉගෙනුමක් තක්සේරු කරන්නේ කෙසේද ?

ක්‍රියාකාරී ඉගෙනුම පිළිබඳව ඔබට ප්‍රායෝගිකව අදහස් ලබා ගැනීමට උපකාරී වන ක්‍රමවේද කීපයක් පිළිබඳව සලකා බලමු.

**නිරීක්ෂණය**

- පළපුරුදු ගුරු සගයකු විසින් වූ උගන්වන පාඩමක් නිරීක්ෂණය කරන්න
- එම පාඩම් තුළ ඔබ දුටු සුවිශේෂී ලක්ෂණ ගැන අවධානය යොමු කරන්න
- ඒම පාඩමේ ක්‍රියාකාරී ඉගෙනුම යොදාගත හැකි අවස්ථා මොනවාදැයි ඔබගෙන්ම විමසන්න

**සැලසුම**

- පාඩමෙන් පසුව එය ඔබේම ඉගැන්වීමකට අදාළ කරගත හැකි ආකාරය ගැන සිතා බලන්න
- ඔබට ඉගැන්වීම සඳහා ඇති පාඩමක ට ක්‍රියාකාරී ඉගෙනුම ක්‍රියාත්මක කිරීමට අත්හදා බැලීමක් සිදු කරන්න

**ප්‍රත්‍යාවේක්ෂණය**

- පාඩම් අවසානයේ සිදු වූ දේ ගැන මෙනෙහි කරන්න
- එය හොඳින් සිදුවූයේ ද ? නැති ද ?
- ඊළඟ වතාවේ ඔබ වෙනස්කම් කරන්නේ කෙසේද

වෙනස්කම් සමග නැවතත් හදා බැලීම කරන්න

අඛණ්ඩව ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද ඉගැන්වීම් කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කළ හැකි ආකාර පිළිබඳ ව සිතන්න

වැඩිදුර තොරතුරු රැස් කරන්න (උදා: ඥගාය චින්තන ව්‍යාපෘතිය / ORBIT ව්‍යාපෘති සඳහා වන වෙබ් අඩවි/




**04: විවිධ ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම හඳුනා ගනිමු.**















































ඔබත් උත්සාහ කරන්න.

ඉහත ක්‍රියාකාරකම් අතරින් කිහිපයක් විස්තර කරනු ලැබේ.



සිතන - යුගල - හවුල think – pair – share



සිද්ධි අධ්‍යයනය

**case studies**



කතන්දර කැට (Story Cubes)

ප්‍රතිලාභ

ක්‍රියාත්මක කරන්නේ කෙසේද

විවිධ විෂයන් සඳහා භාවිතය

ප්‍රතිලාභ

ක්‍රියාත්මක කරන්නේ කෙසේද

ප්‍රතිලාභ

ක්‍රියාත්මක කරන්නේ කෙසේද

කතන්දර කැට සකස් කිරීම

- සහයෝගී ඉගෙනුම් උපාය මාර්ගයකි
- සිසුන්ට ගැටලුවක් විසඳීමට හෝ ප්‍රශ්නයකට පිළිතුරු දීමට පවරා ඇති විටඑකට වැඩ කරති
- එකම ක්‍රියාකාරකමක් තුළ පුද්ගල චින්තනය , සහයෝගීතාවය , ඉදිරිපත් කිරීම, දිරිමත් කරන සහ ඒ ස හා ඉඩ දෙන තාක්ෂණයකි.
- මාතෘකාවක් ගැන තනි තනිව සිටීමට
- ප්‍රශ්නයකට පිළිතුරු දීමට
- පන්තියේ සෙසු සිසුන් සමග අදහස් බෙදා ගැනීමට
- අන් අයට ඇහුම්කන් දීමට
- හවුල්කරුවෙකු සමග පිළිතුරක් සාකච්ඡා කිරීමට
- සවන්දීම සහ කියවීමේ අවබෝධය වැඩිද දියුණු කර ගැනීමට
- සහභාගිත්වය උපරිමය කිරීමට
- අවධානය යොමු කිරීමට
- කියවීමේ තොරතුරු අවබෝධ කර ගැනීමට
- සිසුන් සම්බන්ධ කර ගැනීමට
- සිසුන්ගේ පරාවර්තනය සිතීම සහ නව තොරතුරු සැකසීම සඳහා කාලය ලබා දෙයි
- සිසුන්ගේ විචේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීමට
- ලැජ්ජාශීලී සිසුන්ට හවුල්කරුවෙකු සමග බෙදා ගැනීමෙන් පසු පන්තිය සමග වඩා සැප පහසු ලෙස සහ විවෘත කතා කිරීමට අවස්ථාව

එය ඔබ පන්ති කාමරයේ භාවිතා කළ යුතු ඉගැන්වීමේ උපාය මාර්ගයකි

- ශිෂ්‍යයන් පළමුව විමසුමට තනිව පිළිතුරු දිය යුතු ය.
- දෙවනු ව යුගල් වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් එකතු වී ඔවුන්ගේ සාකච්ඡාව සහ තීරණ පන්තිය සමඟ බෙදාගත යුතුය.
- බෙදාගැනීමට පෙර හවුල්කරුවෙකු සමඟ පිළිතුරක් සාකච්ඡා කිරීම සහභාගීත්වය උපරිම කරයි.
- අවධානය යොමු කිරීමට උපකාරී වේ.

- ආරම්භ කිරීමට පෙර සිසුන්ට තාක්ෂණය පැහැදිලි කරන්න.
- අරමුණු විස්තර කරන්න.
- සාකච්ඡා මාර්ගෝපදේශ සහ කාල සීමාවන් සකසන්න. (අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න සිසුන් දැන සිටින බව සහතික කිරීම සඳහා උපාය මාර්ග සකස් කරන්න)

පියවර 01 - සිතන්න - think

- නිශ්චිත ප්‍රශ්නයකින් පටන් ගෙන පිළිතුරක් ගැන තනි තනිව සිතා බැලීමට සිසුන්ට කාලය ලබා දෙන්න
- ප්‍රතිචාර ලිඛිතව හෝ පින්තූරවලින් හෝ තනිවම ලේඛනගත කරවන්න.
- මෙම කොටස් සඳහා සිසුන්ට විනාඩි 1 සිට 3 දක්වා කාලයක් ලබාදිය හැකිය

පියවර 02 - යුගල කරන්න pair

- සිසුන් ට දැන් වශයෙන් සම්බන්ධ වීමට අවස්තාව දෙන්න. (ඔබ යුගල අනුයුක්ත කරන්නේ ද නැතහොත් සිසුන්ට ඔවුන්ගේ හවුල්කරුවන් තෝරාගැනීමට ඉඩ දෙන්නේ ද යන්න කලින් තීරණය කරන්න)
- යුගල කරන විට ශිෂ්‍යයන්ගේ පෞරුෂය ගැන සිතීමට මතක තබා ගන්න.
- ඉදිරිපත් කළ දේ ඔවුන්ගේ හවුල්කරුවන් සමඟ බෙදා ගැනීමට සාකච්ඡා කරන්න.
- සිසුන්ට එකිනෙකාගෙන් විමසීමට ඔබට ප්‍රශ්න සැපයිය හැකිය
- ක්‍රියාකාරකමෙහි මෙම කොටස අවම වශයෙන් මිනිත්තු 5ක් ගත වනු ඇත

පියවර 03 - බෙදාගන්න share

- පන්තියක් ලෙස නැවත එකතු වී සමස්ත පන්ති සාකච්ඡාවක් පවත්වන්න.
- එක් එක් යුගලයෙන් එක් අයෙකු ට පන්තිය සමඟ අදහස් බෙදා ගැනීමට හැකිය
- සිසුන්ට සිතීමට අභියෝග කරන විට මෙම ක්‍රියාකාරකම වඩාත් හොඳින් ක්‍රියාත්මක වේ
- හවුල්කරුවන් සමඟ ගොඩනගා ගත් අදහස් කණ්ඩායමක් සමඟ බෙදා ගැනීමේදී වඩාත් සංශෝධනය වේ.
- හවුල්කරුවෙකු සමඟ සහයෝගයෙන් කණ්ඩායමට අදහස් ඉදිරිපත් කිරීම සමහර සිසුන්ට වඩාත් පහසුවක් වනු ඇත.
- නිතරම සමීප සගයා සමඟ හවුල් වීම පාලනය කරමින් වෙනත් අය සමඟ සංයෝග වීමට අවස්ථාව ලබා දෙන්න

- අභියෝග
  - සිසුන්ගේ සහභාගීත්වය
  - සිත් ගන්නා මාතෘකා සොයා ගැනීමෙන් හෝ අභ්‍යාසයට සහභාගී වීම ස හා ලකුණු ලබා දීමෙන් සහභාගීත්වය වැඩි කළ හැකිය
  - වෙනත් ක්‍රම ගැන ඔබට සිතා බැලීමට හැකිය .
  - නිශ්චිත කාලසීමාවක් ලබාදීම මගින් සහ එම කාලයට අනුව කළමනාකරණය කිරීමෙන් කාලය අපතේ යාම වළක්වා ගත හැකිය.

## විෂයන් කීපයක් සඳහා

### භාෂා කලාව

කියවීමේ අවබෝධය සහ විචේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම සඳහා පොතක් හෝ පරිච්ඡේදයක් අවසන් කිරීමෙන් පසු භාවිතා කරන්න

තේමාවන් සහ චරිත පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබාගැනීමට සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න ( W5 -කවුද ? කුමක්ද? කොහෙද? ඇයි? කවදාද?

### සමාජ අධ්‍යයනය

ඒකකයක් ආරම්භයේ දී මාතෘකාවක් පිළිබඳව සිසුන් දැනටමත් දන්නා දේ සොයා ගැනීමට භාවිතා කළ හැකිය

මාතෘකාව ගැඹුරින් සාකච්චා කිරීමේ දී මෙම තාක්ෂණය භාවිතා කර සිසුන් විෂය කරුණු සමඟ සම්බන්ධ කිරීම. උදා ශිෂ්‍යයන්ට හැඟෙන්නේ කෙසේ ද

යම් කාලපරිච්ඡේදයක් තුළ ජීවත් වූවා නම් කරන්නේ කුමක් දැයි විමසන්න

සදාචාරාත්මක ප්‍රශ්නයක් ගැන සිතන්නේ කුමක්දැයි

### ගණිතය

මෙම උපායමාර්ගය සමග හොඳින් ක්‍රියාත්මක වන ප්‍රශ්න අතර වචන ගැටළු තර්කන ගැටලු සහ ගණිත රටා ඇතුළත්වේ සිසුන් ගැටළුවට එළඹෙන්නේ කෙසේද සොයා ගැනීමට උත්සාහ කරන විට මෙම උපක්‍රමය භාවිතා කරන්න

මෙම උපායමාර්ගය සමග හොඳින් ක්‍රියාත්මක වන ප්‍රශ්න අතර වචන ගැටළු තර්කන ගැටලු සහ ගණිත රටා ඇතුළත්වේ සිසුන් ගැටළුවට එළඹෙන්නේ කෙසේද සොයා ගැනීමට උත්සාහ කරන විට මෙම උපක්‍රමය භාවිතා කරන්න.

### විද්‍යාව

කල්පිත සැකැස්ම හා අත්හදා බැලීමේ අර්ථ නිරූපණය අතරතුර චින්තනය යුග කොටස් භාවිතා කළ හැකිය

නව මාතෘකා හඳුන්වාදීම සඳහා ද භාවිත කළ හැකිය

එනම් අප දැනටමත් අවකාශය ගැන දන්නේ කුමක්ද

ශාක වර්ධනය වීමට අවශ්‍ය වන්නේ මොනවාද

ඔබ ඉගැන්වීම් පිළිබඳ කුමන මට්ටමේ අදත්දැකීම් තිබුනත් ඔබ උගන්වන්න ේ කාටද යන්න සිතීමේ යුගල්ෙ කාටද යන්න සිතීමේ යුගල කොටස් ක්‍රමය භාවිතා කිරීම මාතෘකා හඳුන්වා දීමට සාකච්ඡාවට පහසුකම් සැලසීමට හෝ විෂයක් පිළිබඳ අවබෝධය සහ සාපේක්ෂතාව වැඩිදියුණු කිරීමට හොඳ ක්‍රමයකි පුළුල් ලෙස භාවිතා වන මෙම ඉගැන්වීමේ තාක්ෂණය සිසුන්ට ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමටත් පසුව ඒවා බෙදා හදා ගැනීමටත් ඉදිරිපත් කිරීමටත් දිරිගන්වයි එමගින් විචේචනාත්මක චින්තනය සවන්දීම සහ ඉදිරිපත් කිරීම වැනි කුසලතා වැඩි දියුණු වෙයි.

### සිද්ධි අධ්‍යයනය case studies

- යම් කාර්යයක් සඳහා දැඩිව අවධානය යොමු කිරීමේ හැකියාව
- විශ්ලේෂණාත්මක චින්තනය වැඩි දියුණු වීම
- නිර්මාණශීලී චින්තනය
- සිද්ධි අතර සහ සම්බන්ධතාවය වටහා ගැනීම
- අනුපිළිවෙල වටහා ගැනීම
- ගැටළු හඳුනාගැනීම
- ගැටළුවක් සඳහා ඇති විවිධ විසඳුම් හඳුනාගැනීම
- හඳුනා ගත් විවිධ විසඳුම් අතරින් වඩාත් ඵලදායි විසඳුම භාවිතා කිරීම
- නව අවබෝධයක් ඇතිවීම

- සිසුන් විසින් කලින් නිර්වචනය කරන ලද දත්ත කට්ටලයක් හෝ දර්ශනයක් හෝ යෙදුමක් හෝ සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වන ක්‍රියාකාරකමකි . සිද්ධි අධ්‍යනය මගින් තොරතුරු සෙවීමට සහ ප්‍රතිචාර දැක්වීම ට ඇසීමට ප්‍රශ්න ලැයිස්තුවක් සකස් කර ගත යුතුය. මෙය ඉතා නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයකි. සිද්ධි අධ්‍යනයක සිද්ධි වලට පැහැදිලි පිළිතුරක් නොමැත. මෙහිදී අමතර තොරතුරු හා දත්ත රැස් කිරීමටත් විවේචනාත්මකව ප්‍රශ්න ඇසීමටත් , සිසුන්ට අවබෝධය ලබාගත හැකිය.
- සිද්ධි අධ්‍යයනය කිරීම සඳහා සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දීමට වගබලා ගන්න. එවිට ප්‍රශ්න වලට යොමු වීමට පෙර අන්තර්ගතය සම්පූර්ණයෙන්ම වටහා ගත හැකිය.
- පළමු වරට සිද්ධි අධ්‍යයනයක් පන්තියට හඳුන්වා දෙන විට ක්‍රියාකාර කළමනාකරමනාකරණය කළ හැකි වැඩ කොටස් සඳහා අවධානය යොමු කරන්න
- කණ්ඩායම් කාර්යයේ රැඳී සිටින බව තහවුරු කරගැනීම සඳහා ඔබ පන්ති කාමරය තුල සංසරණය වීම අත්‍යාවශ්‍ය වේ.

සිද්ධි අධ්‍යයනය ක්‍රියාත්මක කිරීමේදී ඔබ වැඩිදුරටත් අවධානය යොමු කළ යුතු කරුණු

- සිසුන්ට විසඳුම් ඉදිරිපත් කිරීමට පෙර සිද්ධි අධ්‍යයනයේ වැදගත් කරුණු සාරාංශ කරන ලෙස ඉල්ලා සිටින්න.
- සිසුන්ගේ විසඳුම් විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පසු විපරම් ප්‍රශ්න මාලාවක් අසන්න
- නව කණ්ඩායමක් සමඟ වැඩ කිරීමට , නව පිළිතුරු දැකීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- විවිධ සිද්ධි අධ්‍යයනය සමඟ කටයුතු කිරීමට ඔවුන් යොමු කරන්න

කතන්දර කැට story cubes

බොහෝ විට ඔබට මෙය නව අත්දැකීමක් විය හැකිය.

ප්‍රාථමික පන්ති සඳහා වඩා සුදුසු ඉගෙනුම් ක්‍රම වේදයකි.

ඔබ නිර්මාණාත්මක වීමෙන් විෂය කැට ලෙස ද්විතීක ශ්‍රේණි සඳහා භාවිත කළ හැකිය.

කතන්දර කැට ,යම් සංවාදයක් හෝ කතාවක් විමසීමට භාවිතා කරන විවිධ රූප සහිත පින්තූර සහිත dias 9 කි.

කතන්දර කැට භාවිතයේ ප්‍රතිලාභ

- **කතන්දර මගින් අදහස් ඉදිරිපත් කිරීමට උපකාර කිරීම.**
- **කතන්දර කීමේ කුසලතා ගොඩනැගීම සඳහා විවිධ ආකාරවලින් භාවිත කළ හැකිය.**
- **කණ්ඩායම් සැකසුමකදී සහයෝගයෙන් කතා පවසන බැවින් සන්නිවේදනය කණ්ඩායම් වැඩ කිරීමේ කුසලතා ගොඩනැගීමට**
- **චින්තන රටාවෙන් පිටතට සිතීමට**
- **මෙය ක්‍රීඩාවක් වුවද දරුවන්ට කතන්දර කීමේ වැදගත් අංගයන් වන සැලසුම් කිරීම , සැකසුම නිර්මාණය කිරීම, සිදුවීම් අනුපිළිවෙල, හැඟීම් සාකච්ඡා කිරීම, ක්‍රියා සහ ප්‍රතිවිපාක අවබෝධ කර ගැනීම, නිර්මාණය කිරීම වැනි උසස් මට්ටමේ කුසලතා ඉගෙන ගැනීමට අවස්ථාව සපයයි.**
- **නිර්මාණශීලීත්වයට**
- **භාෂා සහ සමාජ විශ්වාසය සහ දැනුම වර්ධනය කිරීමට**
- **පරිකල්පනය කුසලතා වර්ධනය කිරීමට**
- **ශිෂ්‍යන්ගේ ස්වයං ප්‍රකාශන වර්ධනයට**
- **අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීමට**
- **නිර්මාණාත්මක චින්තනය උත්තේජනය කිරීමට**
- **විශිෂ්ට ඉගෙනුම් අත්දැකීම් ඉස්මතු වීමේ හැකියාව**
- **ආඛ්‍යාන කුසලතා වැඩි දියුණු කිරීමට**
- **කතන්දර කීමට ඇහුම්කන් දීම මගින් වාග් කෝෂය පුලුල් වීම**
- **චිත්ත රූප මැවීමේ හැකියාව**
- **ශ්‍රවන කුසලතා ප්‍රවර්ධනය කිරීම ට**
- **මතකයට අභියෝග කිරීම**
- **දරුවා සමග සාකච්ඡා කිරීමට හා වැඩ කිරීමට හොඳම ක්‍රමයක් ලෙස**
- **සිසුන්ගේ කථන උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීමට (ඇතැම් සිසුන්ට කතා කිරීමට උත්සාහ කිරීමේදී ආතතිය ඇතිවේ. මෙය ඔවුන් හොඳින් සන්නද්ධ නොවීම නිසා හෝ ප්‍රමාණවත් ශබ්ද හෝ නිවැරදි උච්චාරණය හෝ පිළිබඳ ගැටළු, අකමැත්ත හෝ වෙනත් හේතුවක් විය හැකිය එවැනි සිසු සඳහා පර්යේෂකයින් මෙම ක්‍රමය යෝජනා කරති.**
- **කතන්දර කැට යනු ක්‍රීඩාවකට වඩා වැඩි යමකි.**

කතන්දර කැට සකස් කිරීම

අවශ්‍ය ද්‍රව්‍ය

**කඩදාසි කියුබ් අච්චුව ( ඉතා මැනවින් කාඩ් පතේ මුද්‍රණය ණය කර ඇත.)**

**කතුර පැන හෝ කළු දෘඩ සලකුණු වර්ණක ද්‍රව්‍ය**

අවම වශයෙන් හිස් කතා කියුබ් සැකිලි තුනක්වත් ඒෆෝ කඩදාසි මත මුද්‍රණය කරන්න.

ඔබට මුද්‍රණ යන්ත්‍ර පහසුකම් නොමැති නම් කියුබ් අච්චුවක් යොදා ගත හැකිය.




ඒහි ඔබට අවශ්‍ය රූප අදින්න. ( කැමති ඕනෑම රූපයක් ඇදිය හැකිය. උදා ලෙස විවිධ අක්ෂර, රූප, නාම පද , ක්‍රියා පද, විෂයට අදාළ දේ )

වර්ණය ( අත්‍යාවශ්‍ය නොවේ. කුඩා ළමුන් වර්ණ ප්‍රිය කරයි)

කතුර භාවිතයෙන් කපා ගන්න.

සැකිලි වල රේඛාව ඔස්සේ නමාගන්න. ඝණක හැඩයක් නිර්මාණය කරගන්න.

සැකිලි මත ගම් ගා අලවන්න( ඔබට මේ කාර්යයට ශිෂ්‍ය සහාය ලබාගත හැකිය)




කතන්දර කැට භාවිතා කරන්නේ කෙසේද ?

1. මූලික කතන්දර
   අවම වශයෙන් කැට තුනක් භාවිතා කරන්න.
   එක් එක් කැටය විසි කරන්න. කැටේ මුහුණත භාවිතා කරමින් කෙටි කතාවක් කියන්න
2. උසස් කතන්දර කීම
   ඒක් කතන්දර කියුබයක සියලු පැති භාවිතා කරමින් කතාවක් පැවසීමට අභියෝග කරන්න.
3. වචන හයේ කතන්දර
   ඝනකයේ ඒක් පැත්තක් භාවිතා කරමින් වචන හයක කතාවක් ලියන්න හෝ කියන්න යොමු කරන්න. වැඩි අවස්ථා ඇති කිරීමට වචන හයක කතාවකට කතන්දර කියුබ් දෙකක් එක් කිරීමට උත්සාහ කරන්න.
4. සහයෝගී කතා කීම
   මෙම ක්‍රීඩාව finish the story ක්‍රීඩාවට බෙහෙවින් බෙහෙවින් සමානය.
   අවම වශයෙන් ශිෂ්‍යයන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක සහයෝගයෙන් කතාවක් කීම ( සෑම ක්‍රීඩකයකු ම කතා කීපයක් රෝල් කිරීම. පළමු ක්‍රීඩකයා ඔහුගේ ඝනකය මත ඇති රූපය භාවිතා කරමින් . කතාව ආරම්භ කරයි. ඊළඟ ක්‍රීඩකයා කතන්දර ඝනකයක් ගෙන එය පෙරලා දමයි. ඉන්පසු පෙර ක්‍රීඩකයාගේ කතාව තම ඩයිස් රූපය භාවිත කරමින් ඉදිරියට ගෙනයයි. සියලුම ක්‍රීඩකයන් මේ අආකාරයෙන් සහභාගී කර ගනිමින් කතාව ඉදිරියට ගෙන යන්න
5. මිත්‍රත්වය ගොඩනගා ගන්න
   කතන්දර කැට එකිනෙකා දැන හඳුනා ගැනීම ට හොඳ ක්‍රමයකි. යුගල වශයෙන් වැඩ කරමින් සෑම ක්‍රීඩකයෙක් ම කතන්දර ඝනකය පෙරලා දමයි. රූපයට අදාළ කතාවක් හෝ රූපය පිළිබඳ සිත්ගන්නා කරුණක් හෝ ලබාදිය යුතුය.
6. අදහස් උත්පාදනය
   කැට තුනක් පෙරළන්න.
   කුමන රූප වලට මුහුණ දුන්න ද මේ සියල්ල භාවිතා කර අවම වශයෙන් වෙනස් කතා අදහස් තුනක් ඉදිරිපත් කළ යුතුය
7. භූමිකාව රඟ දැක්වීමේ ක්‍රියාකාරකම
   මෙම ක්‍රියාකාරකම සඳහා ක්‍රීඩකයින් දෙදෙනෙකු අවශ්‍ය වේ.
   සෑම කෙනෙකුටම තමන්ගේම චරිත ඝනකයක් ඇත.
   ඔවුන් දෙදෙනාම ඔවුන්ගේ කැට පෙරලන අතර ඕනෑම චරිතයක් ඉහලට මුහුණලා සිටියත් ඔවුන්ගේ චරිතය එකිනෙකා සමග කතා කිරීමට මවා පෑමට සිදුවේ.

## මම ඇසූ දේ මට අමතකය. මා දකින දේ මතකය. මා කරන දේ මට පැහැදිලිය.

## පැරණි චීන හිතෝපදේශය

මතක තබා ගන්න. ඔබ භාවිතා කළ ක්‍රමවේදයක් ඔහුට හෝ ඇයට අසීරු විය හැකිය. නමුත් ඔබ සතුව තවත් බොහෝ ක්‍රමවේද ඇත. එහෙත් ඔවුනට පැහැදිලි වන සේ කියා දීමට සිටින්නේ ඔබ පමණි.



**ඇගයීම**

මෙම මොඩියුලයෙන් ඔබ ලබා ගත් දැනුම පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන දිගුව (link) මත click කර එහි ඇති ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන්න.

Link: https://forms.gle/jebJZ9TfbHP8p195A